රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2018 ජනවාරි 29

**ප්‍රවෘත්ති නිවේදනයː**

## ශ්‍රී ලංකාව තුළ ඉංග්‍රීසි භාෂාව ප්‍රචලිත කිරීමට ඇමෙරිකානු සහාය

ශ්‍රී ලංකාව තුළ ඉංග්‍රීසි භාෂාව ප්‍රචලිත කිරීම සඳහා ඇමෙරිකානු සාම බලකායේ ස්වේච්ඡා සම්පත් දායකයින්ගේ සහාය ලබා ගැනීම වෙනුවෙන් සකස් කළ ද්විපාර්ශවීය ගිවිසුමට අත්සන් තැබීම ජනවාරි අවසන් සතියේ දී කොළඹ දී සිදු කිරීමට නියමිතය. ඒ වෙනුවෙන් ඇමෙරිකානු සාම බලකායේ ප්‍රධාන විධායක නිලධාරී ෂේලියා ක්‍රොව්ලි මහත්මිය දිවයිනට පැමිණීමට නියමිතය. ගරු අග්‍රාමාත්‍යතුමාගේ ආරාධනය පරිදි ඇමෙරිකානු සාම බළකායේ නියෝජිත පිරිසක් මීට පෙර, 2017 මැයි මස 14- 26 දිනවල ශ්‍රී ලංකාව තුළ සංචාරය කරන ලදී. එම නියෝජිත කණ්ඩායමේ නිර්දේශ මත ඇමෙරිකානු සාම බලකාය විසින් තම ස්වේච්ඡා වැඩසටහන් ශ්‍රී ලංකාව තුළ නැවත ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

ඇමෙරිකා එක්සත් ජනපද රජයට අනුබද්ධ ස්වේච්ඡා සංවිධානයක් ලෙස 1961 මාර්තු මස 01 වැනි දින ඇමෙරිකානු සාම බලකාය ආරම්භ කරන ලදී.මෙම සංවිධානය ආරම්භ කිරීමේ අරමුණ වූයේ අධ්‍යාපන, කෘෂිකර්ම, තාක්ෂණික, සෞඛ්‍ය, වෙළෙඳ සහ සමාජ සංවර්ධන යන අංශයන්ට වෘත්තීය නිපුණත්වයකින් යුතු සේවකයන් සැපයීමය. ඇමෙරිකානු පුරවැසියන්ට මෙම සංවිධානය සඳහා ස්වේච්ඡාවෙන් සම්පත් දායකත්වය සැපයිය හැකිය. විදේශ රටවල කෙරෙන සංවර්ධන වැඩසටහන් වලදී වසර දෙකකට නොඅඩු ව්‍යාපෘති කාලයක් සඳහා සම්පත් දායකත්වය සැපයීමට එම ස්වේච්ඡා සේවකයන්ට සිදුවේ. එසේ සිටිමින් අදාළ රටේ දේශීය භාෂාව ඉගෙන ගැනීම, කතා කිරීම සහ එරට සමාජ තත්වයන්ට, ජීවන රටාවන්ට හුරුවෙමින් දේශීය ජනතාව සමඟ සමීපව කටයුතු කිරීම මෙම ස්වේච්ඡා සම්පත්දායකයන් තුළින් අපේක්ෂා කෙරේ. ඇමෙරිකා එක්සත් ජනපදය හැරුණු කළ කොරියාව, ජපානය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින්ද මෙවැනි ආකාරයේ ස්වේච්ඡා වැඩසටහන් ලොව පුරා ක්‍රියාත්මක කරනු ලබයි. මීට පෙර 1983 වසරේදීද ශ්‍රී ලංකාව තුළ ඇමෙරිකානු සාම බලකායේ ස්වේච්ඡා වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණ.

ඇමෙරිකානු සාම බලකායේ නියෝජිත කණ්ඩායමක් විසින් පසුගියදා ශ්‍රී ලංකාව තුළ සිදුකළ සංචාරයේදී මතුකරන ලද විශේෂ නිරීක්ෂණයක් වූයේ ඉංග්‍රීසි භාෂාව පුහුණු කරන්නන් සඳහා මෙරට තුළ දැඩි අවශ්‍යතාවක් පවතින බවයි. එසේ හෙයින් ඇමෙරිකානු සාම බලකායට

අනුයුක්ත ස්වේච්ඡා සම්පත්දායකයන් විසින් පාසැල්, ද්විතීයික අධ්‍යාපන ආයතන, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන වල උදව් ඇතිව දේශීය ගුරුවරුන්ගේ සහ සිසුන්ගේ ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමේ ශක්‍යතාව වර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙනු ඇත. විදේශ කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සහ සර්වෝදය වැනි රාජ්‍ය නොවන සංවිධාන විසින් දැනටමත් ඇමෙරිකානු සාම බලකාය සමග සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කැමැත්ත පළ කර ඇත. ඉදිරියේදී, අධ්‍යාපන අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින පුහුණු මධ්‍යස්ථාන වලට ඇමෙරිකානු සාම බලකායේ ස්වේච්ඡා සම්පත් දායකයන් අනුයුක්ත කෙරෙනු ඇත.

මෙම වැඩපිළිවෙළ යටතේ පළමු ස්වේච්ඡා සම්පත් දායකයින් කණ්ඩායම නැගෙනහිර වෙරළ තීරයේ පුහුණු මධ්‍යස්ථාන වෙත අනුයුක්ත කෙරෙනු ඇත. දෙවැනි කණ්ඩායම මධ්‍යම පළාතටත් ඉන් අනතුරුව සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ස්වේච්ඡා සම්පත් දායක කණ්ඩායම් ස්ථාපිත කරලීමටත් සැලසුම් කර ඇත. එම ස්වේච්ඡා සම්පත්දායකයින් දේශීය සත්කාරක පවුල් සමඟ මාස 27 ක කාලයක් මෙරට රැඳී සිටිමින් රට පුරා ඉංග්‍රීසි භාෂාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ඇත. මෙම වැඩපිළිවෙළ යටතේ පළමු ස්වේච්ඡා සම්පත්දායක කණ්ඩායම 2019 වසරේ සැප්තැම්බර් මාසයේදී දිවයිනට පැමිණීමට සැලසුම් කර තිබේ. ඉන් අනතුරුව සෑම වසරකම ඔක්තෝබර් මාසයේදී අලුත් සම්පත්දායක කණ්ඩායම් දිවයිනට පැමිණීමට නියමිත ය. පළමු කණ්ඩායම ස්වේච්ඡා සම්පත්දායකයින් 30-35 අතර ප්‍රමාණයකින් සමන්විත වනු ඇත. එම ප්‍රමාණය 2021 වනවිට 120 දක්වා වර්ධනය කර ගැනීමට ඇමෙරිකානු සාම බලකාය අපේක්ෂා කරයි.



**නීතිඥ සුදර්ශන වික්‍රමසිංහ ගුණවර්ධන**
**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්**